**ශීර්ෂය 114 - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුලත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 114 - ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය.** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.11 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.12 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2.1 (අ) |
| | | 2. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම. | 2.2.1 (ආ) i – xvii<br>2.2.1.(ඇ) i – iv |

| | | | |
|---|---|---|---|
| | | 3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම නිසා පරිසරයට සිදු වී තිබෙන බලපෑම. | 2.2.1 (ඇ) |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු. | 2.3 |
| | | 5. අභ්‍යන්තර විගණනය | 2.11 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකායරක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.4 (අ) |
| | | 2. කාර්යාල පවත්වා ගැනීමේ අඩුපාඩු. | 2.4 (ආ) |
| | | 3. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්. | 2.4 (ඇ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරීයා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම. | 2.5 |
| | | 2. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.10 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.7 (අ) i |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.7 (අ) ii |
| | | 3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු. | 2.7 (අ) iii |

| | | | |
|---|---|---|---|
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු. | 2.8 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |

**මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.4 (ඇ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන්

### 2.1 කාර්යසාධනය

### 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති

#### 2.2.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 36,166 ක් වූ මාතර - කතරගම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2013 අගෝස්තු 01 දින ආරම්භ කර 2016 ජූලි 31 දින වන විට නිම කළ යුතු ව තිබුණි. ව්‍යාපෘතියේ වැඩ නිසි පරිදි ඉටුකිරීමට කොන්ත්‍රාත්කරු අසමත්වීම නිසා 2018 ඔක්තෝබර් 26 දක්වා නැවත වරක් කාලය දීර්ඝ කර තිබුණි.

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

**---------------------------------------**

**සංඥා පද්ධතිය ස්ථාපනය කිරීම**

**---------------------------------**

මාතර සිට කතරගම දක්වා වූ දුම්රිය මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියේ මාතර සිට බෙලිඅත්ත දක්වා සංඥා, විදුලි සංදේශ හා දුම්රිය හරස් මාර්ග ආරක්ෂිත පද්ධතියක් සවි කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 16,975,533 ක කොන්ත්‍රාත් වටිනාකමකට සංශෝධිත ගිවිසුමක් (Addendum) 2017 ජුලි 27 දින අත්සන් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i) මුල් ගිවිසුමෙන් සංඥා පද්ධතිය ඉවත් කිරීම**

**--------------------------------------------**

සංඥා හා විදුලි සංදේශ පද්ධතියක් ද ඇතුළුව එක්සත් ජනපද ඩොලර් මිලියන 290 ක මුල් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්ත්‍රාත් පිරිවැයට අනුව (Schedule of Contract Price) තාක්ෂණික ඇගයීම් කමිටු ඉදිකිරීම් නිර්දේශ කර තිබුණ ද 2010 ජුලි 22 දිනැති අංක අමප/10/1352/445/028 දරන කැබිනට් අනුමැතිය මත මෙම සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම මුල් කොන්ත්‍රාත්තුවෙන් ඉවත් කර තිබුණි. පසුව 2017 මැයි 24 දිනැති අංක අමප/17/0974/709/039/ටීබීආර් දරන කැබිනට් අනුමැතිය මත සංශෝධිත ගිවිසුම මගින් මුල් කොන්ත්‍රාත් සමාගම වන චයිනා මැෂිනරි ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් ආයතනයට කොන්ත්‍රාත්තුව නැවතත් වසර 06 කට ආසන්න කාලයකින් පසුව ප්‍රදානය කර තිබුණි. මේ නිසා ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාද වුවත් කොන්ත්‍රාත්කරුට ප්‍රමාද ගාස්තු ගෙවීමකින් තොරව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමට අවස්ථාව ලැබී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ii) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

**-------------------------------**

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තිය ප්‍රකාරව ජාත්‍යන්තර තරඟකාරී මිළ ගණන් කැඳවීමකින් කොන්ත්‍රාත්කරු තෝරාගත යුතු වුවද සංඥා පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තු තරඟකාරී මිළ ගණන් කැඳවීමකින් තොරව මාතර - කතරගම දුම්රිය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අතිරේක ප්‍රතිපාදන (Provisional Sum) වලින් ඉතිරි ප්‍රතිපාදන මත මුල් කොන්ත්‍රාත් සමාගම වෙත එක්සත් ජනපද ඩොලර් 16,975,533 ක් පිරිවැයකට 2017 මැයි 24 දින කැබිනට් අනුමැතිය මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

**(iii) කොන්ත්‍රාත් වැඩසටහන් සංශෝධනය කිරීම**

**--------------------------------------------**

කොන්ත්‍රාත් කොන්දේසි 8.3 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ වැඩසටහන අනුව ප්‍රගතිය ලඟා කර ගත නොහැකි අවස්ථාවල සංශෝධිත වැඩසටහනක් ඉදිරිපත් කළ යුතු වුවද එක්සත් ජනපද ඩොලර් 16,975,533 ක පිරිවැය වූ ඉහත කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු විසින් 2017 ජුලි අවසානයේ ඉදිරිපත් කළ වැඩසටහන අනුව කාර්යය ඉටු නොකිරීම මත සංශෝධිත වැඩසටහනක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සංශෝධිත වැඩසටහනක් 2018 අගෝස්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා සැලැසුම් කළ ප්‍රගතිය හා සත්‍ය ප්‍රගතිය ඇගයීමක් සිදු කළ නොහැකි විය.

(iv) **ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කිරීම**

කොන්ත්‍රාත් වැඩසටහන අනුව කොන්ත්‍රාත්කරු විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ අනුමැතිය ලබාගත යුතු වුවද ඉහත කොන්ත්‍රාත්තුවේ සංඥා උපකරණ හා උපාංග සැපයීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 12.91 ක් ඇස්තමේන්තු කර තිබුණ ද ඒ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා කොන්ත්‍රාත් වැඩසටහන අනුව සංඥා උපාංග මිළදී ගැනීම 2017 අගෝස්තු මාසයේ සිට 2018 මාර්තු දක්වා වූ කාලය තුල ඉටුකළ යුතු වුවද ඒ සඳහා කාල සටහනක් අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2018 අගෝස්තු 31 දක්වාත් උපාංග මිලදී ගැනීමට නොහැකි වී තිබුණි.

(v) **ඉදිකිරීම් ප්‍රගතිය**

සංඥා පද්ධති ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජූලි මස ආරම්භ කර 2018 අගෝස්තු එනම් මාස 13 කින් දුම්රිය ධාවනය සඳහා භාරදිය යුතු වුවද 2018 අගෝස්තු 31 දින වන විටත් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 36 ක් විය.

(ඇ) **මාතර - කතරගම නව දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **කොන්ත්‍රාත් වැඩසටහන් ඉදිරිපත් කිරීම**

කොන්ත්‍රාත් කොන්දේසි 8.3 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් අදාළ ප්‍රගතිය සැලැසුම් කල කාලසීමාව අනුව ඉටුකළ නොහැකි අවස්ථාවල සංශෝධිත වැඩසටහන් ඉදිරිපත් කළ යුතු වුවද, 2016 ඔක්තෝබර් මස ඉදිරිපත් කර තිබූ සංශෝධිත වැඩසටහන් අංක 13 න් පසුව කොන්ත්‍රාත්කරු විසින් වසර 01 මාස 07 ක් ගතවීමෙන් පසුව 2018 මැයි 31 දින සංශෝධිත කොන්ත්‍රාත් වැඩසටහනක් (Master Program) ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. මේ නිසා ඉදිකිරීම් ප්‍රගතිය පරීක්ෂා කල නොහැකිවීම, ඉදිරි වැඩ හඳුනාගැනීමට නොහැකිවීම ආදිය හේතුකොට ගෙන කොන්ත්‍රාත් අධීක්ෂණය නිසි පරිදි ඉටුකළ නොහැකිවීම හා ඉදිකිරීම් ප්‍රමාදයන් සිදු වී තිබුණි.

(ii) **දුම්රිය මාර්ගය ඉදිකිරීම**

ඉහත කොන්ත්‍රාත්තුවේ කිලෝමීටර් 32 ක් වූ දුම්රිය මාර්ග ඉදිකිරීම් සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 26.88 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් වෙන්කර 2018 මාර්තු 31 වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 11.85 ක පිරිවැයක් දරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් දක්නට ලැබුණි.

- <u>කොන්ත්‍රාත් ඉදිකිරීම් ඉටු නොකර ගෙවීම් කිරීම</u>

  දුම්රිය මාර්ග ඉදිකිරීම් (Main Track Laying) සඳහා ගිවිසුම අනුව එක්සත් ජනපද ඩොලර් 8,064,000 ක් වෙන් කර දී තිබුණු අතර 2018 මාර්තු අවසන් වන විට ඒ සඳහා එක්සත් ජනපද ඩොලර් 5,126,458 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. නමුත් එදිනට ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හෝ උපදේශන කොන්ත්‍රාත් සමාගම සතුව නොතිබුණි. එබැවින් එම වටිනාකම ගෙවීම සඳහා කිලෝමීටර් 20.3 ක ඉදිකිරීම් සම්පූර්ණ විය යුතු වුවද 2018 මැයි 27 දින කොන්ත්‍රාත්තුව භෞතික පරීක්ෂාවේ දී එසේ එම ප්‍රමාණය ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

()

- එමෙන්ම මාර්ගය සකස් කිරීම් (3rd Tamping) භෞතික පරීක්ෂාවන් සිදු කරන 2018 මැයි 27 විටත් ඉදිකිරීම් කර නොතිබුණ ද ඒ සඳහා එක්සත් ජනපද ඩොලර් 564,547 ක් 2018 මාර්තු 31 දින අන්තර් ගෙවීම් සහතික පත්‍ර 47 මගින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.

**(iii) අමු ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීම**

-----------------------------------

මූලික කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි 14.5 (C) වගන්තිය ප්‍රකාරව වැඩබිමේ ඇති අමුද්‍රව්‍යය සඳහා ගෙවීම් සිදු නොකළ යුතු වුවද 2018 මාර්තු අවසන් වන විට (වරාය දක්වා ප්‍රවාහනය කර තිබුණු) රේල් පීලි වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 3,648,703 ක් සහ වැඩබිමේ ඇති සිල්පර සහ කළුගල් වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් 1,413,734 ක් දුම්රිය මාර්ග ඉදිකිරීම් අවසන් කර ගෙවීම් කිරීම වෙනුවට අමුද්‍රව්‍ය වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

**(iv) රේල්පීලි හා සිල්පර ගුණාත්මය තහවුරු කිරීම**

---------------------------------------------

කොන්ත්‍රාත් කොන්දේසි 7.4 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් රේල්පීලි හා සිල්පරවල ගුණාත්මය තහවුරු කිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ සහතිකයක් ලබා දිය යුතු වුවද 2018 මාර්තු 31 දින එක්සත් ජනපද ඩොලර් 4,526,117 ක පිරිවැයකට මිළදී ගන්නා ලද රේල්පීලි හා සිල්පර වල ගුණාත්මය තහවුරු කිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මෙය දේශීය වශයෙන් පරීක්ෂාව සිදු කර වාර්තාවක් ලබාදීමට ව්‍යාපෘති ඒකකය අපොහොසත් වී තිබුණි.

**(v) තොග පාලනය**

----------------

කිලෝමීටර් 32 ක් දක්වා වූ දුම්රිය මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් මිළදී ගත යුතු රේල්පීලි හා සිල්පර ප්‍රමාණය තීරණය කළ යුතු වුවද, ඒ සඳහා මිළදී ගත යුතු රේල් පීලි ප්‍රමාණය, භාවිතා කර ඇති තොගය හා ඉතිරි ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවක් ලබාදීමට ව්‍යාපෘති උපදේශන සමාගම අපොහොසත් වී තිබුණි. මේ නිසා මිළදී ගන්නා ලද රේල්පීලි සම්බන්ධයෙන් තොග පාලනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

**(vi) දුර්වල පස් ඉවත් කර වැඩි දියුණු කිරීම. (Weak Soil Improvement Methods)**

---

කඳු බෑවුම් ප්‍රදේශ වල දුර්වල පස් ඉවත් කර වැඩි දියුණු කිරීම සඳහා D.C.M. Filling Method ක්‍රමය කොන්ත්‍රාත් ගිවිසුමේ ගෙවීම් විස්තරය (Scheduled of Payment) මගින් නිර්දේශ කර තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් මේ සඳහා කුමන ක්‍රමයක් භාවිතා කළේද යන්න තහවුරුවකින් තොරව 2018 මාර්තු අවසන් වන විට එම කාර්යය සඳහා එක්සත් ජනපද ඩොලර් 23,606,282 ක මුදලක් උපදේශන සමාගමේ නිර්දේශය මත ගෙවීම් කර තිබුණි. භාවිතා කළ ක්‍රමවේදය සහ අනුමත කර තිබූ ක්‍රමවේදය සඳහා පිරිවැය සැසඳීමක් සිදු කර නොතිබුණි.

**(vii) සැලැසුම් සඳහා අනුමැතිය ලබාදීම (Design Approval)**

---

කොන්ත්‍රාත් කොන්දේසි 5.1 වගන්තිය ප්‍රකාරව සැලැසුම් සඳහා අනුමැතිය ලබාදීම උපදේශන කොන්ත්‍රාත් සමාගමේ ප්‍රධාන කාර්යභාරයක් වුවද එම වගන්තිය ප්‍රකාරව අවස්ථා 04 ක් යටතේ විස්තරාත්මක නිර්මාණ අනුමැතිය ලබාදිය හැකි වුවද ඊට පරිබාහිරව Approved in Principle යටතේ අනුමැතිය ලබාදීම වෙනුවෙන් 2018 මාර්තු අවසන් වන විට නිර්මාණ අනුමැතිය සඳහා එක්සත් ජනපද ඩොලර් 6,732,905 ක් උපදේශන කොන්ත්‍රාත් සමාගමට ගෙවා තිබුණි.

**(viii) අවසන් නිර්මාණ ඉදිරිපත් කිරීම (As Built Documents)**

---

කොන්ත්‍රාත් කොන්දේසි 5.6 වගන්තිය ප්‍රකාරව අනුමත Shop Drawing සඳහා උපදේශන කොන්ත්‍රාත් සමාගම වෙතින් අනුමැතිය ලබාගත යුතු වුවද ඒ සඳහා අනුමැතියක් ලබා නොගෙන එක්සත් ජනපද ඩොලර් 52,780 ක් ගෙවා තිබුණි.

**(ix) ඉදිකිරීම් ප්‍රමාදය**

---

කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් 2013 අගෝස්තු ආරම්භ කර 2016 ජූලි අවසන් කිරීමට සැලැසුම් කළද එක්සත් ජනපද ඩොලර් 278.2 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමේ සහ කොන්ත්‍රාත් අධීක්ෂණයේ දුර්වලතාවය මත සැලැසුම් කල කාලය ඉක්මවා වසර 02 කට ආසන්න කාලයක් ගත වී ඇතත් ඉදිකිරීම්වලින් සියයට 76.1 ක් පමණක් 2018 මාර්තු 31 වන විට අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය. එක් එක් ඉදිකිරීම් සඳහා සැලැසුම් කළ ප්‍රගතිය හා සත්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| අයිතමය | සැලැසුම් කළ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | සත්‍ය ප්‍රගතිය (2018.03.31 දිනට) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| දුම්රිය ස්ථාන ඉදිකිරීම | 100 | 57.2 |
| දුම්රිය මාර්ග ඉදිකිරීම | 100 | 30 |
| සමාන්තර මාර්ග ඉදිකිරීම | 100 | 0 |
| සංඥා පද්ධති ඉදිකිරීම | 100 | 9.98 |
| තාවකාලික වෙන් කිරීම් | 100 | 13 |

**(x) පැති බැම් ඉදිකිරීම**

පැති බැම් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් පිරිවැය වශයෙන් එක්සත් ජනපද ඩොලර් 14,288,000 ක් වෙන්කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

- **Soil nail පැති බැම් සම්පූර්ණයෙන් නිම නොවීම.**

උපදේශන කොන්ත්‍රාත් සමාගමේ 2018 මාර්තු ප්‍රගති වාර්තාව අනුව පැතිබැම් (මාර්ගය දකුණු පස හා වම් පස) ස්ථාන 21 ක් ඉදිකිරීමට හඳුනාගෙන තිබුණ ද එහි ප්‍රගතිය සියයට 75 කට වඩා අඩු අවස්ථා 07 ක් නිරීක්ෂණය විය. කෙසේ වුවද 2018 මාර්තු අවසන් වන විටත් අන්තර් ගෙවීම් සහතික පත්‍ර 47 මගින් මෙම පැති බැම් ඉදිකිරීම සඳහා වෙන්කළ එක්සත් ජනපද ඩොලර් 2,857,600 ක සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

- **මාර්ගයේ සීමාවෙන් පිටත ඉදිකිරීම (Construction of right of way)**

Soil nail පැතිබැම් ඉදි කිරීමේ දී දුම්රිය මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් අත්පත් කරගත් භූමිය ඉක්මවා පෞද්ගලික ඉඩම්වල සැතපුම් 17+750 දකුණු පස මාර්ගයේ ඉදිකිරීම් සිදුකර තිබුණු බව ව්‍යාපෘතිය භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට 2018 මාර්තු 31 වන විට එක්සත් ජනපද ඩොලර් 144,229 ක් ගෙවා තිබුණි.

- **පැතිබැම් ඉදිකිරීම වෙනුවට පස් පිරවීම**

ඉදිකිරීම් කොන්ත්‍රාත් අනුමත සැලැසුමට අනුව සැතපුම් DK13+540 සිට DK 13+562 ක දකුණු පස කොටසේ (RHS) මීටර් 22 ක් දිග කොන්ක්‍රීට් පැති බැම්මක් ඉදිකිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 31,109 ක ප්‍රතිපාදනය Scheduled of Payment (SOP) කර තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් පෞද්ගලික ඉඩමක් ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ අනුමැතියකින් තොරව පැතිබැම් ඉදිකිරීම වෙනුවට පස් පිරවීම් කර ගෙවීම් කර තිබූ බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

පැති බැම් ඉදිකිරීම වෙනුවට පස් පිරවීම නිසා පිරිවැය වෙනස්වීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමැතියක් ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

**(xi) ඉතිරි පැතිබැම් ඉදිකිරීම**

---------------------------

පැති බැම් ඉදිකිරීම් යටතේ Toe Wall පැති බැම් 28 ක් ඉදිකිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 3,572,000 ක් වෙන්කර දී තිබුණ ද 2018 මාර්තු අවසන් වන විට එයින් පැති බැම් 08 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ සඳහා නිර්මාණ සකස් කර අනුමැතියක් ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකැරුණි. තවද Anchor Frame පැති බැම් සඳහා එක්සත් ජනපද ඩොලර් 1,285,920 ක් වෙන්කර දී තිබුණ ද ඉහත මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ Anchor Frame පැති බැම් කොපමණ මීටර් ප්‍රමාණයක් අනුමත කර තිබේද එයින් කොපමණ ප්‍රමාණයක් විගණිත දින වන විට නිම කර තිබේද සහ ඉතිරිය කොපමණද යන්න පිළිබඳ සාක්ෂි ව්‍යාපෘතිය සතුව නොතිබුණි.

**(xii) විදේශ ණය උපයෝජනය**

---------------------------

ණය ගිවිසුම් කොනදේසි 1.14 වගන්තිය ප්‍රකාරව ණය ගිවිසුම ක්‍රියාත්මක දින සිට වසර 07 ක කාලයක් ණය සහන කාලයක් ලබා දී තිබුණ ද ණය ගිවිසුම 2013 අප්‍රේල් 19 වන දින සිට ක්‍රියාත්මක වන අතර සහන කාලය 2020 අප්‍රේල් මස අවසන් වේ. ණය සහන කාලසීමාව අවසන්වීමට තවත් වසර 02 කට අඩු කාලසීමාවක් පැවතියද 2018 මාර්තු අවසන් වන විට සමස්ථ ඉදිකිරීම් වලින් සියයට 76 ක් පමණක් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව දුම්රිය ධාවනය කර ආදායම් ඉපයීමක් සිදු නොකර ණය ගෙවීම් අවදානමක් පවතින බවද නිරීක්ෂණය විය.

**(xiii) විදේශ විනිමය අලාභයන්**

---------------------------

ණය ගිවිසුම් කොන්දේසි 1.3 වගන්තිය ප්‍රකාරව ණය ගිවිසුම අත්සන් කළ දින සිට වසර 04 ක් ඇතුලත ණය මුදල ලබාගත යුතු වේ. 2013 අප්‍රේල් මස අත්සන් කරන ලද ණය ගිවිසුම අනුව 2017 අප්‍රේල් මස අවසන් වන විට මුළු ණය මුදල ලබාගත යුතු වුවද ඉදිකිරීම් ප්‍රමාදය මත 2017 මැයි මස සිට 2018 අප්‍රේල් මාසය දක්වා කාලසීමාව තුල කරන ලද ගෙවීම් වෙනුවෙන් රු.මිලියන 36.51 ක පමණ විදේශ විනිමය අලාභයක් සිදු වී තිබුණි.

**(xiv) සමාන්තර මාර්ග ඉදිකිරීම්**

----------------------------

මූලික ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සමාන්තර මාර්ග 105 ඉදිකිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 1,693,000 ක කොන්ත්‍රාත් පිරිවැයක් ඇස්තමේන්තු කළද විගණන දිනය වන 2018 මැයි 27 වන විටත් එම මාර්ග සඳහා නිර්මාණ සැලසුම් සකස් කර අනුමැතිය ලබාගෙන ඉදිකිරීම් ආරම්භ කිරීමට ඉදිකිරීම් හා උපදේශන කොන්ත්‍රාත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

**(xv) තාවකාලික ප්‍රතිපාදන භාවිතය**

--------------------------------

මූලික ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව තාවකාලික ප්‍රතිපාදන වෙනුවෙන් වෙන්කර දී තිබූ එක්සත් ජනපද ඩොලර් මිලියන 29, 2017 ජූලි 27 දිනැති සංශෝධිත ගිවිසුම මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 12.02 ක් දක්වා අඩුකර තිබුණි. ඒ අනුව මුල් ගිවිසුමෙන් එම ප්‍රතිපාදනය යටතේ හඳුනාගත් කාර්යභාරය නිම කිරීම සඳහා ප්‍රතිපාදන අඩුකිරීම මත ඉටුකර ගත යුතු වැඩ කොටස් මොනවාද යන්න පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. තවද සංශෝධිත ප්‍රතිපාදනවලින් වෙන් කළ එක්සත් ජනපද ඩොලර් මිලියන 12.02 න් 2018 මාර්තු අවසාන වන විටත් එක්සත් ජනපද ඩොලර් මිලියන 11.13 ක් ඉතිරි වී තිබුණු බවද නිරීක්ෂණය විය.

**(xvi) දුම්රිය ස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම**

--------------------------------------

ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුමේ දුම්රිය ස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා සිමෙන්ති ගඩොලක් 10 Mpa ශක්තියකින් යුතු විය යුතු යන්න සේවා යෝජිත අවශ්‍යතාවයක් (Employer's Requirement) වුවද, උපදේශන සමාගමේ නිර්දේශය මත ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත එය 05 Mpa දක්වා අඩුකර ඉදිකිරීම් අනුමත කර තිබුණි. එම වෙනස් කිරීම මත ඉදිකිරීම් පිරිවැයෙහි වාසිය රු. 6,093,829 ක් ලෙස ඇස්තමේන්තු කර ඇතත් Lump Sum ගෙවීම් ක්‍රමය යටතේ එම වාසිය අමාත්‍යාංශයට ලැබෙන ආකාරය පැහැදිලි නොවිය.

**(xvii) ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම්.**

-----------------------------------------------

දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍යතාවයන් හඳුනාගෙන ඉඩම් අත්පත් කර ගැනීම් සිදු කළ යුතු වුවද, ඉදිකිරීම් සඳහා වන අවශ්‍යතාවයන් ඉක්මවා ඉඩම් අත්පත් කර ගත් අවස්ථා භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**(ඇ) ව්‍යාපෘතිය නිසා පරිසරයට වන බලපෑම්**

----------------------------------------

කොන්ත්‍රාත් ගිවිසුමේ සේවා යෝජිත අවශ්‍යතාවන් සඳහා කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජීය වශයෙන් පැන නගින ගැටළු සඳහා මැදිහත් විය යුතු වුවද 2018 මාර්තු අවසානය දක්වා වෙන් කළ එක්සත් ජනපද ඩොලර් 250,000 ක මුළු වටිනාකමම කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළද විගණිත දිනය වන විටත් පාරිසරික හා සමාජීය ගැටළු රාශියකට කොන්ත්‍රාත්කරු විසින් මැදිහත් නොවුණු අවස්ථා 338 ක් නිරීක්ෂණය විය.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම හා සේවා ලබා ගැනීම

------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගත යුතු වූ රු. මිලියන 293.69 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 42.99 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 250.07 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 85.36 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) වාහන උපයෝජනය

----------------------

2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පහත සඳහන් පරිදි වාහන 71 ක් පැවති අතර, වාහන 13 ක් බාහිර ආයතනවල භාවිතය සඳහා ලබා දී තිබූ අතර වාහන 58 ක් අමාත්‍යාංශය භාවිතා කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.15,089,345 ක්ද, වාහන සේවා කිරීම සඳහා හා වාහන අළුත්වැඩියා සඳහා රු.15,559,582 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු. 3,519,476 ක්ද වශයෙන් එකතුව රු. 34,168,403 ක් වැය කර තිබුණි.

<u>ධාවනය කළ කිලෝමීටර් ගණන ඉදිරිපත් නොකිරීම</u>.

අමාත්‍ය කාර්යාලවලට හා අමාත්‍යාංශ නිලධාරීන්ට අනුයුක්ත කර ඇති වාහන 29 ක් සඳහා 2017 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා ධාවනය කරන ලද කිලෝමීටර් ගණන ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්

------------------------------------

අමාත්‍යාංශය මාසිකව රු.5,141,072 ක කුලියක් මත ලබාගත් ගොඩනැඟිල්ලක කාර්යාලය පවත්වා ගෙන යනු ලබන අතර වාර්ෂික ගොඩනැගිලි කුලිය රු. 61,453,924 ක් වී තිබුණි. ඒ අනුව කාර්යාලය පවත්වාගෙන යාමේ ඒක පුද්ගල වියදම රු. 259,298 ක් වී තිබුණි.

### (ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවත්වීම

---------------------------------------

2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

### (ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

-------------------------------------------

අමාත්‍යාංශය විසින් වාහන 13 ක් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණ ද එම වාහනවල අයිතිය පවරාදීමට හෝ නැවත අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5** **බැඳීම් හා බැරකම්**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයන් 08 ක් සඳහා සලසා තිබූ රු. මිලියන 45.38 ක ප්‍රතිපාදන වලින් ඉතිරිය රු. මිලියන 0.477 ක් වූ අතර එය රු. මිලියන 0.06 කින් ඉක්මවා රු. මිලියන 1.34 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි.

**2.6** **තිරසාර සංවර්ධනය**

තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ දී අදාළ කාර්යයන් නිගමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථාන හඳුනාගෙන තිබුණ ද ඒවා ක්‍රියාකාරී සැලැසුම්වලට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.7** **කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 7,032 | 6,893 | 139 | 1.98 |
| | මූලධන | 5,998 | 4,555 | 1,443 | 24.06 |
| | **එකතුව** | **13,030** | **11,448** | **1,582** | **11.73** |
| 2014 | පුනරාවර්තන | 7,556 | 7,548 | 8 | 0.11 |
| | මූලධන | 17,454 | 13,024 | 4,430 | 25.38 |
| | **එකතුව** | **25,010** | **20,572** | **4,438** | **17.44** |
| 2015 | පුනරාවර්තන | 12,595 | 12,471 | 124 | 0.98 |
| | මූලධන | 15,785 | 8,420 | 7,365 | 46.66 |
| | **එකතුව** | **28,380** | **20,891** | **7,489** | **26.39** |
| 2016 | පුනරාවර්තන | 17,910 | 17,238 | 672 | 3.75 |
| | මූලධන | 32,009 | 17,768 | 14,241 | 44.49 |
| | **එකතුව** | **49,919** | **35,006** | **14,913** | **29.87** |
| 2017 | පුනරාවර්තන | 17,838 | 14,072 | 3,766 | 21.11 |
| | මූලධන | 18,114 | 7,931 | 10,183 | 56.22 |
| | **එකතුව** | **35,952** | **22,003** | **13,949** | **38.80** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලබයි.

**(අ) විසර්ජන ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** <u>**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**</u>.

වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 743 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ii)** <u>**අධි ප්‍රතිපාදන සලසා තිබීම**</u>.

වැය විෂයයන් 42 ක් සඳහා එකතුව රු. මිලියන 13,855 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු. මිලියන 8,180 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(iii)** <u>**පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**</u>.

නිසි අධ්‍යයනයකින් සහ අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ප්‍රතිපාදන සලසා නොගත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. මිලියන 19,219 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර එම ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 3,703 ක් ඉතිරි වී තිබුණි.

**2.8 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**-------------------------------------**

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා එකතුව රු. මිලියන 14,400 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. මිලියන 15,446 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 107.26 ක් වී තිබුණි.

**20.03.02.08 දරන ආදායම් සංකේතය - අපගමන බදු**

**-----------------------------------------------------**

අමාත්‍යාංශය විසින් ආදායම රැස් කිරීමට අදාළ බදු හෝ ආදායම් අය කිරීමේ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට ඉහළ දමා තිබුණු බැවින් ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-------------------------------------------**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 10 | 9.98 | 6 | 6.6 | 45 | 32.50 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව (ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර) රු. 1,240,840 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

## 2.10 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 187,887 ක් වූ අතර වර්ෂ 02 ක් ඉක්ම වූ (ඉඩම් හැර) එකතුව රු. 114,552 ක් වූ තැන්පතු 01 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.11 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු නමුත් මු.රෙ. 134(3) ප්‍රකාර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 103 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 551,690 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජේෂ්ඨ මට්ටම | 38 | 28 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 131 | 103 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 84 | 51 | 33 |
| | එකතුව | 258 | 187 | 71 |